# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,108- 2019 ජනවාරි මස 25 වැනි සිකුරාදා - 2019.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 166 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 167 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**වයඹ පළාත් සභාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, 2018.09.20 දිනැති මහා සභා තීරණ අංක 21 යටතේ ගරු මහා සභාවේ ඒකමතික එකඟත්වය ලද කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කළ, කාර්යය කර්තව්‍ය ඉටු කළ, කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ඩී. වික්‍රමසිංහ යන අය විසින් විනෝද බද්ද සම්බන්ධයෙන් ගන්නා ලද 2016.11.15 දිනැති 2002 අංක දරන තීරණය, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර කණපතිපිල්ලෙයි කදිරවේල්පිල්ලෙයි ලෝගේස්වරන් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඉහත සඳහන් කෙරෙන යම් කරුණක් සම්බන්ධයෙන් භාෂා ත්‍රිත්වයෙහි යම් පරස්පරතාවයක් පැන නැගුනහොත් එහිදී සිංහල පිටපතෙහි සඳහන් කරුණ ප්‍රමුඛකොට සැලකිය යුතු ය.

කේ. සී. ලෝගේස්වරන්,
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර.

2018 දෙසැම්බර් මස 12 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, කුරුණෑගල දී ය.

01-645

---

**බස්නාහිර පළාත් සභාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අය කිරීමටත්, එසේ වුව ද නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා තුළ පෙන්වනු ලබන චිත්‍රපට සංදර්ශන සඳහා ඇතුල්වීමේ ගාස්තුවෙන් 7.5% ක විනෝද බද්දක් පනවා අයකිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මහරගම සභාවේ 2018.07.19 දිනැතිව සභාවේ සම්මත කර ඇති යෝජනාව, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුර දේවප්‍රිය වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල
හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ දී ය.

01-580

**ඌව පළාත් සභාව**

1995 අංක 4 දරන ඌව පළාතේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

**11 (1) වැනි වගන්තිය යටතේ නියෝගය**

ඌව පළාතේ 1995 අංක 4 දරන (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 11 (1) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මම පහත සඳහන් ඛනිජ බදු අනුප්‍රමාණය මෙම නියෝගය මගින් 2019.01.01 දින සිට නියම කරමි.

ඛනිජ බද්ද - දළ පිරිවැටුමේ වටිනාකමින් 0.5%

දොන් ආතර් චාමර සම්පත් දසනායක,<br>ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන,<br>නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්,<br>විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල<br>පහසුකම් අමාත්‍ය,<br>ඌව පළාත් සභාව,<br>බදුල්ල.

2018 දෙසැම්බර් මස 28 වැනි දින,<br>බදුල්ලේ දී ය.

01-486

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2018

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව 2018.12.14 දින අංක 2102 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ පහත සඳහන් ඡේද සංශෝධනය කරනු ලැබේ.

ඡේදය 5.3 - වයස - 2019.01.14 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 43 ට නොවැඩි විය යුතුය.

ඡේදය 7.4.1 - දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර රැකියාවක නිරත අයදුම්කරුවකු නම් රැකියාව පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද රැකියාව පිළිබඳ සහතිකයක් ද සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

ඡේදය 09 - *තෝරාගැනීමේ ක්‍රමය* :-

*(අ)* වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තෝරාගැනීම සිදු කරන අතර උපාධිය මූලික සුදුසුකමක්වන රැකියාවක නියුක්තවන අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලබන්නේ රැකියා විරහිත හා උපාධිය සුදුසුකමක් නොවන රැකියාවක නියුතු උපාධිධාරීන්ට අවස්ථාව ලබා දීමෙන් පසුවය.

*(ආ)* අදාළ මාධ්‍යය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ආගමික විෂයයන් හා ආගමික විෂයයන් හා අනුබද්ධ විෂයයන් සඳහා පූජ්‍ය පක්ෂයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

ඡේදය 11.1 - *(ඇ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.02.08 දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. ඉහත *ගැසට්* නිවේදනයේ සඳහන් විෂයයන් 46 ට අතිරේකව විෂයය අංක 47 සිට 51 දක්වා උපලේඛන II සඳහන් විෂයයන් ඇතුළත් කරනු ලැබේ.

03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.02.08 දක්වා දීර්ඝ කරනු ලැබුව ද 2018.12.14 දිනැති ඉහත අංක දරන *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සියලු සුදුසුකම් 2019.01.14 දිනට සපුරා තිබිය යුතුය.

04. මෙම තනතුරට බඳවා ගැනීම සඳහාවන අංක 2102 හා 2018.12.14 දිනැති *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ජනවාරි මස 17 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

## උපලේඛන II

එක් එක් දිස්ත්‍රික්කයේ පුරප්පාඩු විෂයයන් මාධ්‍යය අනුව (✓) ලකුණින් දක්වා ඇත. එම ලකුණින් සඳහන් විෂයයන්ගෙන් පමණක් ඒ ඒ දිස්ත්‍රික්කයේ අදාළ මාධ්‍යයෙන් තෝරාගත යුතුය.

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| කොරියන් | 47 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම කොරියන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | ✓ | - | - | ✓ | - | - |
| ජපන් | 48 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජපන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | ✓ | - | - | ✓ | - | - |
| ප්‍රංශ | 49 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ප්‍රංශ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | ✓ | - | - | ✓ | - | - |
| ජර්මන් | 50 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජර්මන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | ✓ | - | - | ✓ | - | - |
| චීන | 51 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම චීන භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | ✓ | - | - | ✓ | - | - |

02-770

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.